ප්‍රධාන ලේකම් කාර්යාලය
සබරගමුව පළාත් සභාව
பிரதான செயலாளர் அலுவலகம்
சபரகமுவ மாகாண சபை
Office of the Chief Secretary
Sabaragamuwa Provincial Council

ප්‍රධාන ලේකම් / Chief Secretary: 045 - 2231703
කාර්යාලය / அலுவலகம் / Office: 045 - 2222143, 045 - 2222144, 045 - 2223080, 045 - 2232263
ෆැක්ස් / தொலைநகல் / Fax: 045 - 2222793
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail: chiefsecretary@sg.gov.lk, suniljayalath@gmail.com

පළාත් සභා කාර්යාල සංකීර්ණය, නව නගරය, රත්නපුර. மாகாண சபைக் கட்டிடத் தொகுதி, புதிய நகரம்-இரத்தினபுரி. Provincial Council Complex, New Town, Ratnapura.

| මගේ අංකය / எனது இல. / My Ref. | ඔබේ අංකය / உமது இல. / Your Ref. | දිනය / திகதி / Date |
|---|---|---|
| DCSPT/04/T1/01/01 | | 2026/01/30 |

ප්‍රධාන ලේකම් චක්‍රලේඛ අංක - 01/2026

සබරගමුව පළාත් සභාවේ සියළුම ආයතන ප්‍රධානීන් වෙත.

**<u>සබරගමුව පළාත් කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකකයේ නව www.mdtu.sg.gov.lk අන්තර්ජාලගත පරිගණක වැඩසටහන.</u>**

කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකයේ මෙහෙයුම් කටයුතු සඳහා නව අන්තර්ජාලගත පරිගණක වැඩසටහනක් සකස් කර මේවන විට අන්තර්ජාලයට එක් කර ඇති අතර, එම කටයුතු සඳහා මීට පෙර පැවති පද්ධතියේ මෙහෙයුම් කටයුතු විධිමත් කිරීමට නිකුත් කර තිබූ 2012.10.31 දිනැති අංක 01/2012 ප්‍රධාන ලේකම් චක්‍රලේඛය 2026 පෙබරවාරි 01 දින සිට බලරහිත කරනු ලබන අතර, එදින සිට මෙම චක්‍රලේඛය බලාත්මක කෙරේ.

2. ඒ අනුව සබරගමුව පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකකය (MDTU) මගින් සිදු කරනු ලබන සියලුම පුහුණු වැඩසටහන්වල මෙහෙයුම් කටයුතු වඩා විධිමත් කිරීම මෙම නව අන්තර්ජාලගත පරිගණක වැඩසටහන (online System) තුළින් සිදු කළ යුතු වේ.

3. මෙහිදී මූලිකවම පහත සඳහන්වන පුහුණු හා සම්බන්ධ කටයුතු, මෙම අන්තර්ජාලගත පරිගණක වැඩසටහන හරහා සිදුකිරීමට නියමිතය.

- කළමණාකරන සංවර්ධන හා පුහුණු ඒකකය විසින් පවත්වනු ලබන පුහුණු වැඩමුළු පිළිබඳ දැනුවත් කිරීම සහ එම පුහුණු වැඩමුළුවලට නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවීම.
- ඒ ඒ පුහුණු වැඩමුළු සඳහා තෝරාගත් නිලධාරීන් පුහුණු වැඩමුළු සඳහා කැඳවීම.
- විදේශ පුහුණු පාඨමාලාවලට අයදුම්පත් ඉදිරිපත් කිරීම.
- දේශීය පෞද්ගලික පාඨමාලාවලට අයදුම්පත් ඉදිරිපත් කිරීම.
- පුහුණු වැඩමුළුවලට අදාල තොරතුරු, නිබන්ධන,දේශන සටහන්,චක්‍රලේඛ ආදිය බෙදාහැරීම
- පුහුණු වැඩමුළු පිළිබඳ ඇගයීම් කටයුතු
- මීට අමතරව පුහුණු කටයුතු හා සම්බන්ධ විවිධ තොරතුරු ඕනෑම නිලධාරියෙකුට මෙම ක්‍රමය මගින් ලබා ගැනීමේ හැකියාව පවතී.

4. පුහුණු වැඩසටහන්/වැඩමුළුවලට සහ අදාල කටයුතු මෙම අන්තර්ජාලගත පරිගණක වැඩසටහන මඟින් පමණක් සිදුකරනු ලබන අතර, මෙම පරිගණක වැඩසටහන ඔබ ආයතනය තුළ ක්‍රියාත්මක කිරීම ඔබගේ අධීක්ෂණය යටතේ ඔබ ආයතනයේ පුහුණු විෂයභාර නිලධාරියෙකු නම් කර ඔහුගේ/ඇයගේ රාජකාරි ලැයිස්තුවට මෙම විෂය ඇතුලත් කිරීමට කටයුතු කරන ලෙස දන්වමි. එසේම දැනට නම් කර තිබූ නිලධාරීන් සඳහා 2026/01/14 දින පුස්සැල්ල කළමනාකරණ සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේදී මූලික පුහුණුවක් ලබා දී, ඔබ ආයතනයට අදාල පරිශීලක ගිණුමේ තොරතුරු ද ලබා දීමට කටයුතු කරන ලදී.

5. අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ වන පුහුණු වැඩමුළු ද ඇතුළුව කළමණාකරන සංවර්ධන හා පුහුණු ඒකකයෙන් පැවැත්වීමට නියමිත සියළුම පුහුණු වැඩසටහන් පිළිබඳව www.mdtu.sg.gov.lk වෙබ් අඩවිය මඟින් දැනුම් දෙනු ලබන අතර, එම පුහුණු වැඩසටහන්වලට ඔබ ආයතනයෙන් ඉල්ලුම් කරන නිලධාරීන් හට ඔබගේ පූර්ව අනුමැතිය මත පුහුණු විෂයභාර නිලධාරියා හරහා මෙම පරිගණක වැඩසටහන ඔස්සේ ඉල්ලුම් කළ හැකිය.එසේ ඉල්ලුම් කළ නිලධාරීන් පුහුණු වැඩසටහනට තෝරාගතහොත්, ඒ බව අදාල නිලධාරීන්ගේ ජංගම දුරකතනය වෙත කෙටි පණිවිඩයක් මඟින් දැනුම් දෙනු ලබන අතර, අදාල කැඳවීමේ ලිපිය email මඟින් අදාල නිලධාරියාට, පුහුණු විෂය භාර නිලධාරියාට හා ඔබ ආයතනයට වශයෙන් යාවත්කාලීන කර ඇති තොරතුරුවලට අනුව යොමු කරනු ලැබේ.

6. මින් ඉදිරියේ දී, 2025.02.25 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ 02/2015 පරිදි පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් විසින් විවිධ ආයතනවල හදාරනු ලබන දේශීය පෞද්ගලික පාඨමාලා සඳහා අනුමැතිය ලබාගැනීමේදී හා ගාස්තු අයදුම්කිරීමේ දී ඉදිරිපත් කලයුතු PCA 01 අයදුම් පත්‍රය ඉදිරිපත් කිරීමට හා යාවත්කාලීන කිරීම් සඳහා ද මෙම පරිගණක වැඩසටහන භාවිතා කර සිදුකල යුතුය.

7. පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් විසින් විදේශීය පාඨමාලා සඳහා අයදුම් කිරීමේ දී FCA 01 අයදුම් පත්‍රය ඉදිරිපත් කිරීමේ සිට ඊ වාර්තාව ලබා දීම දක්වා වන ක්‍රියාවලිය මෙම පරිගණක වැඩසටහන භාවිතා කරමින් යාවත්කාලීන කිරීම් සිදුකල යුතුය.

8. ඔබ ආයතනයේ අන්තර්ජාල පහසුකම් ලබා ගෙන නොමැති නම් එම පහසුකම ලබාගැනීමට කටයුතු කරන ලෙසත්, මෙම අන්තර්ජාලගත පරිගණක වැඩසටහන සම්බන්ධව ඔබ ආයතනයේ සියළුම නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත්, මෙම පද්ධතිය සාර්ථකව පවත්වාගෙන යාම සඳහා ඔබ ආයතනයේ ක්‍රියාකාරී දායකත්වය ලබා දිය යුතු බවත් අවධාරණය කරමි.

ඊ.කේ.එ.සුනීතා,
ප්‍රධාන ලේකම්,
සබරගමුව පළාත.

ඊ. කේ. ඒ. සුනිතා
ප්‍රධාන ලේකම්
සබරගමුව පළාත